**යාපනය සහ කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය - 2020**

-----------------------------------------------------------------------------------

යාපනය සහ කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 පෙබරවාරි 08 දින එළඹි අංක 2710 - එස්ආර්අයි (සාමාන්‍ය මෙහෙයුම්) ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය සහ අංක 2711 - එස්ආර්අයි (එස්එෆ්) (විශේෂ මෙහෙයුම්) ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සහ 2017 දෙසැම්බර් 15 දින එළඹි අංක 3603-එස්ආර්අයි හා අංක 3604-එස්ආර්අයි (අතිරේක මූල්‍යනය) ණය ගිවිසුමේ IV වන ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, උතුරු පළාතේ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ උතුරු පළාතේ පළාත් පාලන ආයතන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘති ප්‍රදේශයේ නේවාසිකයන් සඳහා ජල සම්පාදන හා සනීපාරක්ෂක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ යාපනය අර්ධද්වීපයේ ජල සම්පත් ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම් අනුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන සංරචක යටතේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 16,474.59 කට සමාන එජඩො මිලියන 147.45 ක් විය. ඉන් රු.මිලියන 8,541.76 කට සමාන එජඩො මිලියන 76.45 ක් මූල්‍යනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණු අතර රු.මිලියන 5,363.04 කට සමාන එජඩො මිලියන 48 ක් මූල්‍යනය කිරීමට ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය (Agence Francaise de Development) එකඟ වී තිබුණි. ඉතිරි රු.මිලියන 2,569.79 කට සමාන එජඩො මිලියන 23 ශ්‍රී ලංකා රජය මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, ව්‍යාපෘතියේ ජල මූලාශ්‍රය වූ ඉරණමඩු වැව, මුහුදු ජලය පිරිපහදු කිරීමේ පිරියත ලෙස වෙනස් කොට සිදු කළ විෂය පථය ප්‍රතිව්‍යුහගත කිරීම් හේතුවෙන් ව්‍යාපෘතියේ ඇතැම් කටයුතු අත්හිටුවීමට සිදු වීම නිසා ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය ලබා දුන් ණය අවලංගු කරන ලදි. මේ නිසා, ආසියානු සංවර්ධන බැංකුව සමඟ ශ්‍රී ලංකා රජය 2017 දෙසැම්බර් 15 දින අතිරේක ණය ගිවිසුමකට එළඹී තිබුණි. අතිරේක ණය ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘතියේ කටයුතු සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 23,256කට සමාන එජඩො මිලියන 153 කි. ඉන් රු.මිලියන 18,240 ට සමාන එජඩො මිලියන 120 ක් මූල්‍යනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි රු. මිලියන 5,016 කට සමාන එජඩො මිලියන 33 ශ්‍රී ලංකා රජය මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය 2011 පෙබරවාරි 15 දින ආරම්භ කරන ලද අතර එය 2017 අගෝස්තු 14 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, ව්‍යාපෘතිය කාලය 2026 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.1 වගුවේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ

වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය හා සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ. ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය හා සම්බන්ධ පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

## 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- |
| (අ) වටිනාකම රු. මිලියන 190.99ක් වූ විනිමය ලාභය මූල්‍ය ප්‍රකාශනවල අර මුදල් මූල්‍යන ප්‍රභවය යටතේ දක්වනවා වෙනුවට ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. | අග්‍රිම ගිණුම ව්‍යාපෘතියේ එදිනෙදා මෙහෙයුම් කටයුතු වෙනුවෙන් විවෘත කරන ලද නිසා මහ බැංකුව විසින් සිදු කරන ඩොලර් ප්‍රත්‍යාගණන ගණුදෙනු මෙම බැංකු ගිණුමටම ශ්‍රී ලංකා රුපියල් මගින් හර හා බැර කෙරේ. 2011 වර්ෂයේ සිට මාසික ඩොලර් ප්‍රත්‍යාගණනයට සමාන ශ්‍රී ලංකා රුපියල් වටිනාකම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ ශුද්ධ ඩොලර් ප්‍රත්‍යාගණන ලාභය/ ආලාභය ලෙස දක්වයි.<br>කෙසේ වුවද, එය ජංගම වගකීම් යටතේ දක්වනවා වෙනුවට අරමුදල් මූල්‍යන ප්‍රභවය යටතේ දැක්වීම අවශ්‍ය නම්, ව්‍යාපෘතිය 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඒ අනුව ඉදිරිපත් කරනු ඇත. | අරමුදල් මූල්‍යන ප්‍රභවය යටතේ ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ වටිනාකම රු. මිලියන 8,472.10 ක් විය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව, කෙරීගෙන යන වැඩ වටිනාකම රු. මිලියන 9,406.14 ක් විය. ව්‍යාපෘතිය විසින් සැසඳීම් නොවූ වෙනස රු.මිලියන 819.88ක් ලෙස හඳුනාගෙන තිබුණද, මූල්‍ය ප්‍රකාශනවල එම වෙනස නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘතිය විසින් ව්‍යාපෘතියේ කෙරී ගෙන යන වැඩ ශේෂයට හා මණ්ඩලයේ කෙරී ගෙන යන වැඩ ලෙජර ශේෂයට විස්තරාත්මක ගැලපුම් සිදු කර ශේෂ දෙකම තුලනය කරන අතර එම කෙරී ගෙන යන වැඩ සැසඳුම් ප්‍රකාශ මණ්ඩලයේ ගිණුම් අංශයට වාර්ෂිකව ඉදිරිපත් කරයි. ඒ අනුව, ව්‍යාපෘතිය 2020 දෙසැම්බර් 31 දිනට කෙරී ගෙන යන වැඩ සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර අවශ්‍ය කටයුතු සඳහා මණ්ඩලයේ ගිණුම් අංශය වෙත ඉදිරිපත් කර ඇත. කෙසේ වුවද, ශේෂයන් දෙක සැසඳීමට මණ්ඩලයේ ගිණුම් අංශය හා ව්‍යාපෘතිය කඩිනම් ක්‍රියාමාර්ග ගනු ඇත. | ශේෂය සැසඳුම් කිරීමට පියවර ගත යුතුය. |

## 2.2 නීති, රීති සහ රෙගුලාසි සමග අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
| --- | --- | --- |
| (අ) පිඩික් මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද අංක 14.8 හි පොදු කොන්දේසි අනුව සහතික කරන ලද බිලක් දින 56 ක් ඇතුළත නිරවුල් කළ යුතුය. කෙසේ වුවද, බිලෙහි අඩංගු දේශීය අරමුදල් ප්‍රමාණය ගෙවීම ප්‍රමාද වීම මත 2020 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරු ප්‍රමාද ගාස්තු ලෙස රු.මිලියන 1.06 ක් අය කර තිබුණි. | ගෙවීම් වලට අදාල ඡේද අංක 14.7 අනුව අතර මැදි ගෙවීම් බිල්පත් ලැබී දින 56 ක් ඇතුළත ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුට ගෙවීම් කළ යුතුය. එසේ නැතහොත්, ප්‍රමාද ගෙවීම්වලට අදාල ඡේද අංක 14.8 පරිදි කොන්ත්‍රාත්කරුට 14.7 වගන්තිය අනුව ගෙවීම් කර නොතිබුණි නම්, එම ප්‍රමාදය සඳහා මූල්‍ය ගාස්තු අය කිරීමට කොන්ත්‍රාත්කරුට හිමිකම් ඇත.<br>ඒ අනුව, ව්‍යාපෘතිය දේශීය අරමුදල් ප්‍රමාදය සඳහා මූල්‍ය ගාස්තු ගණනය කර 2020 ජුලි 30 දින අංක 475467 දරන චෙක් පතින් රු. 1,061,723.18 ක් ජල කුළුණු (ඊටී 01) ඉදි කිරීම වෙනුවෙන් සියෙරා ඉදි කිරීම් ආයතනය වෙත ගෙවන ලදී. | ප්‍රමාද ගාස්තු ගෙවීම් වලක්වා ගැනීම සඳහා අදාල ගෙවීම් නියමිත කාලය තුළ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2006 ප්‍රසම්පාදන අත්පොතෙහි ඡේද 4.2.3 ට අදාල අංක 31 දරන අතිරේකය අනුව පූර්ව සුදුසුකම් සහිත තරඟකාරී ලංසු කැඳවීම් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සති 17 ක් ඇතුළත සම්පූර්ණ කළ යුතුය. කෙසේ වුවද, ප්‍රසම්පාදන අස්ථිත්වයට මුහුදු ජලය ප්‍රතිවර්ත්‍ය අවශෝෂණ පිරියත ඉදි කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙක් තෝරා ගැනීමට පුවත්පත් දැන්වීම් පළ කළ දින සිට වර්ෂ 3 ක් ගත වී තිබූ අතර 2020 දෙසැම්බර් 31 දින වන විටත් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි. | මුහුදු ජලය ප්‍රතිවර්ත්‍ය අවශෝෂණ පිරියත ඉදි කිරීමේ ටෙන්ඩරය 2016 දෙසැම්බර් 07 දින කැඳ වූ අතර 2017 ජුලි 17 දින අවසන් කරන ලදි. තාක්ෂණික ටෙන්ඩරය 2017 ජුලි 17 දිනත් මූල්‍ය ටෙන්ඩරය 2018 ජුලි 30 දිනත් විවෘත කරන ලදී. කෙසේ වුවද, 2020 අගෝස්තු 31 දක්වා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ ටෙන්ඩර්කරුවන්ගේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ පැහැදිලි කිරීම් සඳහා දින 89 ක්, උපදේශන සහය හා සමාලෝචනය සඳහා දින 41ක්, තාක්ෂණික ඇගයීම් කමිටුවේ ඇගයීම් සඳහා දින 151ක්, අමාත්‍ය මණ්ඩලය පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ තීරණ සඳහා දින 379ක්, ආසියානු සංවර්ධන බැංකුවේ අදහස් දැක්වීම් හා එකඟතාවයන් සඳහා දින 181 ක්, අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීම සඳහා දින 201 ක් සහ අභියාචනා ක්‍රියාවලිය සඳහා දින 99 ක් ගත වන ලදී.<br>මුහුදු ජලය පිරිපහදු පිරියත සැලසුම් කිරීම ඉදි කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා වන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සහ ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රථම ප්‍රසම්පාදනය මෙය වේ. එම නිසා අවම පිරිවැය ඇගයීමක් සහිත ලංසුකරු තෝරා ගැනීම සඳහා ලංසුකරුවන්ගේ, මහ බැංකුවේ මෙන්ම අමාත්‍ය මණ්ඩල පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ හා අසියානු සංවර්ධන බැංකුවේ පැහැදිලි කිරීම් මාලාවක් අවශ්‍යවේ. | චක්‍රලේඛයේ විධි විධානවලට අනුකූල විය යුතුය. |

සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම අනුව ව්‍යාපෘතිය හා අදාල අධිකාරීන් 2020 වර්ෂය අවසානයේ මුහුදු ජලය ප්‍රතිවර්තා අවශෝෂණ පිරියත කොන්ත්‍රාත්තුව ප්‍රදානයකිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගෙන ඇත.

තාක්ෂණ හා මූල්‍ය ඇගයීම් අවසන් වී අමාත්‍ය මණ්ඩලය පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය 2020 ජනවාරි 07 දින ලද අතර ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාවය 2020 පෙබරවාරි 10 දින ලැබී තිබුණි. ප්‍රතික්ෂේපිත ලංසුකරු විසින් 2020 පෙබරවාරි 19 දින ඉදිරිපත් කරන ලද අභියාචනය සලකා බැලූ අතර ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ තීරණය සඳහා ප්‍රසම්පාදන අභියාචනා කමිටුවේ නිල අනුමැතිය 2020 මැයි 28 දින ලබා දෙන ලදී. ඉන් පසුව 2020 ජූලි මස කැබිනට් පත්‍රය ඉදිරිපත් කළ අතර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම 2020 සැප්තැම්බර් 22 දින කැබිනට් මණ්ඩලය අනුමත කරන ලදි.

පසුව, 2021 ජනවාරි 25 වන දින එම්/එස් සූස් ඉන්ටනැෂනල් ආයතනය වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ එම්/එස් සූස් ඉන්ටනැෂනල් ආයතනය අතර කොන්ත්‍රාත් ගිවිසුම 2021 පෙබරවාරි 23 දින අත්සන් කරන ලදි.ආසියානු සංවර්ධන බැංකුවේ පද්ධති වාර්තා අනුව එල් 3603 යටතේ මුහුදු ජලය ප්‍රතිවර්තා අවශෝෂණ පිරියත ඉදිකිරීම සඳහා එජඩො මිලියන 95 ක් වෙන්කර තිබුණද, කොන්ත්‍රාත්තුව එජඩො මිලියන 64.05 කට ප්‍රදානයකර තිබුණි.

2021 ජනවාරියේදී ප්‍රදානය කරන ලද මුහුදු ජලය ප්‍රතිවර්තා අවශෝෂණ පිරියත ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ වැඩ 2021 මාර්තු 08

ආරම්භ කරන ලදි. සංශෝධිත ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අනුව 2023 වර්ෂය අවසානවන විට ප්‍රතිලාභින්ට පානීය ජලය සැපයීමට හැකි වනු ඇත.

**3.** **භෞතික කාර්ය සාධනය**

**3.1** **ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

| **කාර්යයන්** | **2020 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය** | | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිර්දේශය** |
|---|---|---|---|---|
| | **අපේක්ෂිත** | **සත්‍ය** | | |
| (අ)පුමාවේලි, කරවෙඩි, නයිනතිව්, අනලතිව් සහ එලුවයිතිව් යන ස්ථානවල ජල කුළුණු ඉදිකිරීම | 100% (ජල කුළුණු 05) | 44% | ජල කුළුණේ (ඊටී 3) වැඩ නිම කිරීමට ප්‍රමාද වීමට ප්‍රධාන හේතුව රට තුළ කොවිඩ් 19 වසංගත තත්ත්වයේ 2 වන රැල්ල ඇතිවීමයි. සෞඛ්‍ය කාර්යාලයේ වෛද්‍ය නිළධාරීන් වෙනත් පළාත්වලින් පැමිණෙන කම්කරුවන්ට කුළුණු වැඩබිම් තිබෙන දූපත්වලට ඇතුළු වීමට ඉඩ නොදුන් අතර ඔවුන් විසින් දූපත් තුළ ක්‍රියාත්මක කරන ලද දැඩි රෙගුලාසි දූපතේ වැඩ බිම්වල ප්‍රගතියට අහිතකර ලෙස බලපාන ලදී. තවද, 2020 දෙසැම්බර් මස මුල් භාගයේ පුරාවි සුළි කුණාටුවෙන් පසු ඇති වූ ගංවතුර ද ප්‍රගතියට අහිතකර ලෙස බලපාන ලදී. එහෙත්, මේ වන විට වැඩ බිමෙහි ශ්‍රම බලකාය හා යන්ත්‍රෝපකරණ වැඩි කර ඇති අතර කාල දිගුව තුළ වැඩ නිම කිරීමට කොන්ත්‍රාත්කරුට උපදෙස් දී ඇත. | කොන්ත්‍රාත් කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) පලෛ, කොඩිකාමම්, මීසාලෛ, පූන්කරි, පුත්තූර්, නවාත්පුලි, කරෛනගර් හි බෙදාහැරීමේ ජාලයේ නල එළීම. | කි.මී 250 | කි.මී.190 | මෙම කොන්ත්‍රාත්තුව 2018.10.29 දින ප්‍රදානයකරන ලද අතර එය 2020.12.02 දින අවසන් කිරීමට නියමිතය. බෙදාහැරීමේ ජාල පැකේජ ඩීඑන් 2 කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීම ප්‍රමාද වීමට ප්‍රධාන හේතුව රටේ කොවිඩ් 19 වසංගත තත්වයේ 1 වන සහ 2 වන රැල්ල වන අතර කොන්ත්‍රාත්තුව 2021.06.01 දක්වා දීර්ඝ කරන ලදී. | කොන්ත්‍රාත් කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) යාපනය නගර ප්‍රදේශය බෙදා හැරීම ජාලයේ නල එළීම. | කි.මී. 283 | නැත | මෙම කොන්ත්‍රාත්තුව සඳහා ලංසු කැඳවීම 2018 ජුලි 25 ආරම්භ කල අතර 2018 සැප්තැම්බර් 27 දින අවසන් කරන ලදි. තාක්ෂණික ටෙන්ඩරය 2018 සැප්තැම්බර් 27 දිනද, මූල්‍ය ටෙන්ඩරය 2019 ජුලි 10 දින ද විවෘත කරන ලදි.<br>මුහුදු ජලය ප්‍රතිවර්තන අවශෝෂණ පිරියත ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම ප්‍රමාද වීම මත මෙම කොන්ත්‍රාත්තුව ද ප්‍රමාද වූ අතර ඉන් පසුව, කොන්ත්‍රාත්තුව 2021.01.08 ප්‍රදානය කොට 2023.01.23 නිම කිරීමට සැලසුම් කරන ලදි.<br>වැඩ බිම් මට්ටමෙන් සතිපතා රැස්වීම් පැවැත්වීමෙන් හා ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය හා ප්‍රධාන කාර්යාලය අතර මාසික රැස්වීම් පැවැත්වීමෙන් නියමිත කාලය තුල කොන්ත්‍රාත්තුව නිම කිරීම සඳහා ව්‍යාපෘතිය එහි ප්‍රගතිය සමීපව අධීක්ෂණය කරයි. | 2020 දෙසැම්බර් 31 දිනට ණය කාල සීමාව අවසන් වන බැවින් ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (ඈ) චුන්නාකන් ජල සම්පාදන යෝජනා ක්‍රමය ඉදිකිරීම. | කි.මී.50 | නැත | මෙම කොන්ත්‍රාත් පැකේජය සඳහා සියළුම සැලසුම් කටයුතු සහ කෙටුම්පත් ලංසු ලේඛන සකස් කරන ලදී. ව්‍යාපෘතියේ අරමුදල් ලබා ගැනීමේ හැකියාව මත ලංසු කැඳවීම රඳා පවතී. | ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (ඉ) මුහුදු ජලය ප්‍රතිවර්තන අවශෝෂණ පිරියත ඉදි කිරීම. | කොන්ත්‍රාත්තුව 2021 ඔක්තෝබර් මාසයේදී අවසන් කිරීමට නියමිතය. | 2020 දෙසැම්බර් 31 දින වන විටත් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි. | මෙම කොන්ත්‍රාත්තුව 2021 ජනවාරි 25 වන දින සූඑස් ඉන්ටර්නැෂනල් ආයතනය වෙත ප්‍රදානයකරන ලද අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ එම්/එස් සූඑස් ඉන්ටර්නැෂනල් අතර කොන්ත්‍රාත් ගිවිසුම 2021 පෙබරවාරි 23 වන දින අත්සන් කරන ලදි. ඉන්පසු 2021 මාර්තු 08 වන දින වැඩ ආරම්භ කර ඇති අතර වර්තමානයේ සැලසුම් කටයුතු කරගෙන යනු ලැබේ. යාපනය අර්ධද්වීපය සඳහා ආරක්ෂිත පානීය ජලය සැපයීම 2023 දෙසැම්බර් අවසන් වන විට නිම කිරීමට සැලසුම් කර ඇත. | අරමුදල් උපයෝජනය ප්‍රමාද වීම හේතුවෙන් ව්‍යාපෘතියට බැඳීම් ගාස්තු ගෙවීමට සිදුවන නිසා ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ සංශෝධිත විෂය පථය අනුව, යාපනය කිලිනොච්චි ප්‍රදේශයට ජලය සැපයීම සඳහා ප්‍රතිස්ථාපනය කිරීමට සැලසුම් කරන ලද මුහුදු ජලය ප්‍රතිවර්ත්‍යා අවශෝෂණ පිරියත හා ඒ සඳහා ඉදි කරන ලද ජල කුළුණු 2022 වන විට නිම කිරීමට අපේක්ෂිත ය. එම නිසා, ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 1,140 කට ප්‍රදානයකරන ලද ජල කුළුණු 15 ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව සහ ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 5,536 කට ප්‍රදානයකරන ලද නල එළීම් 2018 දෙසැම්බර් 31 වන විට නිම කර තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතිය යටතේ නිම කරන ලද මෙම සියළු ඉදි කිරීම්, නිසි ජල මූලාශ්‍රයක් නොමැති වීමෙන් වර්ෂ දෙකකට වැඩි කාලයක සිට නිශ්කාර්යව පවතී. | ව්‍යාපෘතිය සහ මණ්ඩලයේ ජල සම්පාදන ව්‍යාපතිය අංශය යන අංශ දෙකම ප්‍රධාන සම්ප්‍රේෂණ නල එළීම් හා බෙදාහැරීමේ ජාල භාවිතා කිරීමට ඇති හැකියාව පිළිබඳව හොඳින් සොයා බලයි. පූන්කරි, නයිනතිව්, අනලයිතිව් සහ එලුවලතිව් යන ප්‍රදේශවලට ජලය සැපයීම සඳහා දැනටමත් කිලෝමීටර් 44 ක් දිග සම්ප්‍රේෂණ නල මාර්ග මණ්ඩලයේ ක්‍රියාත්මක හා නඩත්තු අංශය විසින් භාවිතා කරනු ලැබේ.<br><br>තවද, මුහුදු ජලය ප්‍රතිවර්ත්‍යා අවශෝෂණ පිරියත ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද අතර නියමිත පරිදි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කටයුතු කරගෙන යනු ලැබේ. | ව්‍යාපෘතිය යටතේ නිම කරන ලද ඉදිකිරීම් කටයුතු අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ කටයුතු නිම නොවුණද, 2017 වර්ෂයේ සිට ණය ආපසු ගෙවීම ආරම්භ කර තිබුණි. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව 2020 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු. මිලියන 936.15 ක් ණය ආපසු ගෙවීම් ලෙස ණය නියෝජිතායනයට ගෙවා තිබුණි. | ජලය බෙදා හැරීමේ ගැටළුව නිසා ආසියානු සංවර්ධන බැංකුව විසින් එජඩො මිලියන 120ක් වූ අතිරේක මූල්‍යනය යටතේ ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගත කරන ලදි. ඒ අනුව ශ්‍රී ලංකා රජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර එල් 3603 සඳහා එජඩො මිලියන 95 ක් හා එල් 3604 සඳහා එජඩො මිලියන 25 ක් ලෙස 2017 දෙසැම්බර් 15 දින ණය ගිවිසුම් අත්සන් කරන ලදි. ප්‍රතිලාභීන්ට කිසිදු ප්‍රමාදයකින් තොරව පහසුවෙන් ජලය සැපයීම වෙනුවෙන් තල්යාඩිවල මුහුදු ජලය ප්‍රතිවර්ත්‍යා අවශෝෂණ පිරියත ඉදිකිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එල් 3603 යටතේ එජඩො මිලියන 95ක් විශේෂයෙන් ලබා දී ඇත. නමුත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද වීම හේතුවෙන් ආසියානු සංවර්ධන | ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | බැංකුව එල් 3603 යටතේ මෙම කොන්ත්‍රාත්තුව 2021 ජනවාරි 25 දින ප්‍රදානය කරන ලදි. | |
| (ඇ) | අංක 3603 දරන ණය ගිවිසුම අත්සන් කළ දින සිට වසර 2 ක් ගතවී ඇතත් ව්‍යාපෘතිය එහි අරමුදල් භාවිතා කර නොමැති බව අනාවරණය විය. එම නිසා 2020 දෙසැම්බර් 31 දින දක්වා උපයෝජනය නොකළ ණය ශේෂය මත බැඳීම් ගාස්තු ලෙස රු.මිලියන 70.17 ක් ණය නියෝජිතායතනය විසින් අය කර තිබුණි. | ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුමට අනුව, රජයට සපයන ලද ණය සඳහා මූල්‍ය ගාස්තු වර්ෂයකට දෙවරක් අය කරයි. උදා:- 2017 දෙසැම්බර් 15 දින සිට මැයි 15 දින සහ නොවැම්බර් 15 දින. මෙම ණය මුදල යටතේ ආසියානු සංවර්ධන බැංකුවේ උපයෝජන ලෙස මෙම ගාස්තු විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තා වේ. ආසියානු සංවර්ධන බැංකුව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ වාර්තා මත පදනම්ව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ඩීආර්එම්එස් 814 වාර්තාවේ එය ව්‍යාපෘතියේ උපයෝජන ලෙස වාර්තා කරයි. | බැඳීම් ගාස්තු අඩු කිරීම සම්බන්ධයෙන්, ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය ආසියානු සංවර්ධන බැංකුව සමඟ සාකච්ඡා කිරීම අවශ්‍ය වේ. (තෝරා ගන්නා ලද කොන්ත්‍රාත්කරු සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ නොවීම මත ප්‍රසම්පාදන ප්‍රමාදය සිදු වීම නිසා) |

**3.3 වැඩබිම් පරික්ෂාවට අදාල නිරීක්ෂණ**

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේදී පිරිවැය රු. මිලියන 565.09 කට ප්‍රදානය කරන ලද පූමාවේලි, කරවෙඩි, නයිනතිවු, අනලතිව් සහ එලුවලතිවු යන ප්‍රදේශවල ජල කුළුණු 05 ක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2020 දෙසැම්බර් මාසයේදී නිම කිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතිය විසින් ජල කුළුණු හතරක් නිම කිරීම සඳහා 2021 අප්‍රේල් දක්වා කාල දිගුවක් ලබා දී ඇතත්, 2021 මැයි වනතුරුත් එය නිම කර නොතිබුණි. | රට තුළ පැවැති කොවිඩ් වසංගතයේ දෙවැනි රැල්ල ජල කුළුණු වල (ඊටී 3) කාර්යය නිම කිරීම ප්‍රමාදවීමට බලපෑ ප්‍රධාන හේතුව වේ.<br>සෞඛ්‍ය කාර්යාලයේ වෛද්‍ය නිළධාරීන් වෙනත් පළාත්වලින් පැමිණෙන කම්කරුවන්ට කුළුණු වැඩබිම් තිබෙන දූපත්වලට ඇතුළු වීමට ඉඩ නොදුන් අතර ඔවුන් විසින් දූපත් තුළ ක්‍රියාත්මක කරන ලද දැඩි රෙගුලාසි දූපතේ වැඩ බිම්වල ප්‍රගතියට බලපා ඇත. තවද, 2020 දෙසැම්බර් මස මුල් භාගයේ පුරාවි සුළි කුණාටුවෙන් පසු ඇති වූ ගංවතුර ද ප්‍රගතියට අහිතකර ලෙස බලපාන ලදි. එහෙත්, මේ වන විට වැඩ බිමෙහි ශ්‍රම බලකාය හා යන්ත්‍රෝපකරණ වැඩි කර ඇති අතර කාල දිගුව තුළ වැඩ නිම කිරීමට කොන්ත්‍රාත්කරුට උපදෙස් දී ඇත.<br>කොවිඩ් තුන්වන රැල්ල මත නැවත කටයුතු නැවතුන අතර සේවකයන් නිරෝධායනයට ලක්විය. කොන්ක්‍රීට් මිශ්‍රණ පිරියත වසා දැමූ අතර කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත කොන්ත්‍රාත් කාලය 2021.09.28 දින දක්වා දීර්ඝ කරන ලදී. | ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |

### 3.4 මතභේදයට තුඩුදුන් කරුණු

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජල සම්පාදන අමාත්‍යාංශයේ වැය ලෙජරය අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතිය වෙනුවෙන් දේශීය අරමුදල් රු.මිලියන 92.40 ක් වෙන් කර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතිය රු.මිලියන 145.40 ක් වැය කර තිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාකාරී සැලැස්මට හා ප්‍රසම්පාදන සැලැස්මට අනුගතවන පරිදි ආසියානු සංවර්ධන බැංකුව යටතේ හා දේශීය අරමුදල් යටතේ වන අරමුදල් අවශ්‍යතාව සඳහා ප්‍රාග්ධන අයවැය සකස් කර මණ්ඩලයේ ජල සම්පාදන ව්‍යාපෘති අංශය මඟින් ජල අමාත්‍යාංශය වෙත වාර්ෂිකව ඉදිරිපත් කරනු ලැබේ. ඒ අනුව, ව්‍යාපෘතිය ක්‍රියාකාරී සැලැස්ම යටතේ 2020 සඳහා දේශීය අරමුදල් රු.මිලියන 2,014.72 ක් මුලින් ඉල්ලුම් කරන ලදී. පසුව, සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව වියදම් දැරීමට හා කොන්ත්‍රාත්කරුට දේශීය අරමුදල් ගෙවීම් ප්‍රමාද වීම මත කළයුතු පොලී ගාස්තු ගෙවීමෙන් වැලකීම සඳහා අප විසින් ඉල්ලන ලද සංශෝධිත වටිනාකම රු.මිලියන 369.68 ක් විය.<br>කෙසේ වුවද, ව්‍යාපෘතිය රු.මිලියන 369.68 ක් ඉල්ලුම් කළද 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා රු.මිලයන 145.40 ක් පමණක් අපට ලැබුණි. අපහට රු.මිලියන 145.40 ක් ලැබුණ ද 2020 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු බිල් රු.මිලියන 13.98 ක් නිරවුල් කිරීමට නොහැකි විය. 2021 දී මෙම බිල්පත් පියවීමට ව්‍යාපෘතියට හැකි වනු ඇත. | විචලනයන් අවම වන පරිදි අයවැය ලේඛන සකස් කිරීමට ක්‍රියාත්මක කිරීමේ ආයතනය ක්‍රියා කළ යුතුය. |

### 3.5 පද්ධතිය සහ පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව පිළිවෙලින් රු. 25.06 ක්, රුපියල් මිලියන 4.1 ක් සහ රු. 57.26 ක් වූ විද්‍යාගාර උපකරණ, කාර්යාල උපකරණ සහ වාහන සඳහා භෞතික සත්‍යාපනයන් සිදු කර නොතිබුණි. | 2010 නොවැම්බර් ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව, ප්‍රදේශයේ ජල ගුණත්ව කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා ව්‍යාපෘතිය යාපනයේ ප්‍රාදේශීය කළමනාකරණ කාර්යාලයට විද්‍යාගාර උපකරණ 2014 දී රු. 4,884,153.50 කටද, 2015 දී රු. 7,950,000.10 කටද, 2016 දී රු. 12,227,646.50 කටද මිලදී ගෙන සපයා තිබුණි. මෙම විද්‍යාගාර උපකරණ යාපනයේ ප්‍රාදේශීය කලමනාකරණ කාර්යාලයට භාර දී ඇති බැවින්, ව්‍යාපෘතියේ තොග පොත්වල ඒවා නොපෙන්වයි. | ව්‍යාපෘතියේ වත්කම් භෞතිකව සත්‍යාපනය කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කෙසේ වුවද, යාපනයේ ප්‍රාදේශීය කළමනාකරණ කාර්යාලයේ තොග පොත් වල මෙම රසායනාගාර උපකරණ අයිතම, සටහන් කර ඇත. | |
| (ආ) | 2010 ජුලි 26 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 5 ප්‍රකාරව ව්‍යාපෘතියේ ගනුදෙනු, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොතිබුණි. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් 2018 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘතියේ තාක්ෂණික හා මූල්‍ය විගණනය සිදු කරන ලදී. 2021 පෙබරවාරි මාසයේදී ව්‍යාපෘතිය විගණනය සඳහා අභ්‍යන්තර විගණන අංශය පැමිණීමට නියමිතව තිබුණි. කොවිඩ් - 19 වසංගත තත්වය මත රට තුළ පළාත් සංචරණ සීමා පැනවීමෙන් ඔවුන්ට ව්‍යාපෘතිය වෙත පැමිණීමට නොහැකි විය.<br>කෙසේ වුවද, කොවිඩ් -19 වසංගත තත්ත්වය යථා තත්ත්වයට පත්වීමෙන් පසු අභ්‍යන්තර විගණන අංශය විසින් ව්‍යාපෘතියේ තාක්ෂණික හා මූල්‍ය විගණනයක් සිදු කර වාර්තාව ද ඉදිරිපත් කරනු ඇතැයි ව්‍යාපෘතිය විශ්වාස කරයි. | අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. |

### 3.6 ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ ගැටළුව

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතිය යටතේ යාපනය දිස්ත්‍රික්කයේ විවිධ ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණද, එම ඉඩම්වල අයිතිය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා ගෙන නොතිබුණි. | මණ්ඩලයේ රජයේ ඉඩම්, වෙනත් ආයතන සතු ඉඩම් සහ පෞද්ගලික ඉඩම් වෙන්ව හඳුනා ගෙන නියමිත යාන්ත්‍රණයක් මඟින් ඉඩම් පවරා ගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරයි. 2015 දී ආරම්භ කරන ලද බොහෝ ඉඩම් අත්පත් කර ගැනීම්, 2019 වර්ෂයේ නිම කරන ලද අතර, හිමිකාරිත්වය මණ්ඩලය වෙත පවරාගැනීම සඳහා හිමිකාරීත්ව සහතික ලබා ගෙන ඇත. කෙසේ වුවද, ඉදිකිරීම් නිම කර ඇති ඇතැම් ඉඩම් අත්පත් කර ගැනීම සම්පූර්ණ කර නොමැති අතර ඇතැම් ඉඩම් වල ඉදිකිරීම් ආරම්භ කර නොමැත. | ඉඩම්වල අයිතිය පවරා ගැනීම සඳහා මණ්ලය වහාම පියවර ගත යුතුය. |